## 1.1 හැඳින්වීම

ගුවන්විදුලිය වූ කලී සමස්ත විශ්වයම ඇසුරු කැණීත් මිනිස් මනසට පූර්ණව කළ හැකි විශ්මය ජනක මෙවලමකි. විශ්වයේ ඉම නමා යන්නක් එහි පසුළ විනිවිද දකින්නටත් ඊට ඇති හැකියාව සුළු පටු නොවේ. එහි ආශ්චර්යමත් ගනභාව පූරණ කරන්නට උපයෝගී කරගනු ලැබුවේ ශබ්දය, නාද හා වචනය මුල් කොටගත් සංවිධිත භාෂාවයි. එකී භාෂාවේ ඇති ධ්වනි ශක්තිය හෙවත් අනුසරණ බලය විසින් උත්පාදනය කෙරෙන අර්ථ සම්පන්න පරිකල්පනය මිනිසාගේ චින්තනාත්මක ලෝකය පුළුල් කරයි. ගුවන්විදුලි මාධ්‍යය ලබා ඇති විශිෂ්ටතම ජයග්‍රහණය එයයි. එබැවින් මෙය අද වනවිට මානවයා සතුව පවත්නා ඉතා සරල, සියුම් මෙන්ම වචනය් බලසම්පන්නතම සන්නිවේදන මාධ්‍යයකි.

ගුවන්විදුලි නාට්‍ය ශ්‍රාවකයා තුළ අර්ථවත් පරිකල්පනයක් ඇති කිරීමේ වස් ගුවන්විදුලිය සතු ප්‍රබල වැඩසටහන් ආකෘතියකි. ගුවන්විදුලි "නාට්‍ය" සම්භවය ලබන්නේ නාට්‍ය තුළිනි. රංගවින්‍යාසය ආරම්භ කොටගෙන බිහි වූ මෙම නාට්‍ය පසුව ජනජීවිතයේ විවිධ පැති පිළිබිඹු කරන නොයෙක් විෂය ක්ෂේත්‍ර යටතේ විකාශනය වීම සිදු විය. සන්නිවේදනය හා තාක්ෂණයේ දියුණුවත් සමඟ එකෙක් නාට්‍ය තුළ පැවති සම්මත රාමුවෙන් පිටතට පැමිණ විවිධ දේ සන්නිවේදනය උදෙසා මෙම නාට්‍ය ආකෘතිය විද්‍යුත් මාධ්‍යයන්ට සංක්‍රමණය වීම සිදුවිය. මෙලෙස ගුවන්විදුලිය තුළට පැමිණි නාට්‍ය ආකෘතිය තුළ ප්‍රේක්ෂකයා වෙනුවට ශ්‍රාවකයාතු මිහිවිමත් සතර අභිනයන් වෙනුවට වාචික අභිනයන් උපයෝගී කරගැනීමත් සිදුවිණි. ශ්‍රාවකයා පරිකල්පනය මගින් අනර්ඝ වේදිකාවක් මවා ගැනීම මේ හරහා සිදුවිය. ගුවන්විදුලි නාට්‍ය පිළිබඳ අදහස් දක්වන සුගතපාල ද සිල්වා දක්වනුයේ **"ගුවන්විදුලි නාට්‍යයක් වූ කලී වචන, විද්මය, ප්‍රවුතාව හඬ සහ නිශ්ශබ්දතාව නිසියම ශෛලියක සංගීත වින්‍යාසයක් සේ සංකලනය කොට නානා පරිකල්පනයන් නිරන්තරයෙන් උත්තේජනය කරනු වස් බිහි කළ කලා නිර්මාණයක් ලෙසයි."**

ලාංකේය සමාජයට ගුවන්විදුලිය පැමිණෙන්නේ උත්තරාරෝපිත දෙයක් ලෙසය. ඒ බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේදී ය. 1924 ජුනි මාසයේ පමණ ගුවන්විදුලි ප්‍රචාරය ආරම්භ වන අතර ඉන් කෙටි කලකට පසු ගුවන් විදුලි නාට්‍ය ප්‍රචාරය වීම ඇරඹිණි. එනම්, 1927 වර්ෂයේ දීය. මුල් කාලයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නාට්‍ය බිහි වූ අතර පසුව සිංහල ගුවන්විදුලි නාට්‍ය ප්‍රචාරය වීම සිදුවිය. මුල්ම සිංහල ගුවන්විදුලි නාට්‍ය ප්‍රචාරය වූ දිනය නිශ්චිතව සඳහන් කළ නොහැක. මුල් කාලයේ දේශප්‍රේමීත්වය, සාරධර්ම වගා කිරීමේ අරමුණින් නාට්‍ය බිහි වූ අතර නාට්‍යයේ වර්ධනයක්

සිදු වන්නේ 1950 දශකයෙන් පසුවය. මෙහිදී පුළුල් පරාසයක විහිදී ගිය තේමා ඇසුරින් නාට්‍ය බිහි වූ අතර නාට්‍ය ආකෘතිය විශාල දියුණුවක් ලැබීය.

ගුවන්විදුලි නාට්‍ය යනු පැරණිතම මෙන්ම ජනප්‍රියතම ගුවන්විදුලි වැඩසටහන් ආකෘතියකි. විනෝදාත්මක සම්පාදනය මෙන්ම වඩාත් ප්‍රබල ලෙස ශ්‍රාවකයාට බලපෑම් කිරීමට ගුවන්විදුලි නාට්‍ය සතු හැකියාව අනල්පය. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල ගුවන්විදුලි නාට්‍ය ජන සමාජයේ සංවර්ධනය උදෙසා බලපෑම් කිරීමට යොදා ගැනීම ප්‍රබල ආකෘතියකි. අධ්‍යාපන, ආකල්පමය, සාහිත්‍ය, විනෝදාත්මක, සංවර්ධනය, සංස්කෘතික නගා සිටුවීම, පෙළඹවීම, දේශප්‍රේමීත්වය, සාරධර්ම වර්ධනය, මතවාද ගොඩ නැගීම ආදී විවිධ කාර්යයන් සඳහා ගුවන්විදුලි නාට්‍ය ආකෘතිය භාවිතා කර ඇති බවත් ඉන් විශිෂ්ට ප්‍රතිඵල අත්කර ගැනීමට හැකිවූ බවත් ලාංකේය ගුවන්විදුලි නාට්‍යය ඉතිහාසය පිරික්සීමේ දී දක්නට ඇත.

නමුත් දශක ගණනාවක් පුරා පැවති රාජ්‍ය ගුවන්විදුලි ඒකාධිකාරය බිඳ වැටී 1994 වර්ෂයේ පෞද්ගලික ගුවන්විදුලි නාලිකා ආරම්භ වීමත් සමග එතෙක් පැවති ගුවන්විදුලි ආකෘතියකි මෙන්ම වැඩසටහන් අන්තර්ගතය ද වෙනස් විය. මෙහිදී ගුවන්විදුලි නාට්‍ය ආකෘතිය ද මුල් ආකෘතියෙන් සපුරාම වෙනස් ස්වරූපයක් ගෙන තිබේ. මෙම ලිබරල්වාදී ආර්ථිකය තුළ වාණිජත්වයට මුල් තැනක් දී වැඩසටහන් ආකෘති නිපදවීම සිදුවූ අතර සමාජයට සුවිශේෂ බලපෑම් කරන නාට්‍ය ආකෘතිය ද ඒ අනුව හැඩ ගැසීම සිදු වී ඇත.

වර්තමානයේ ආකල්ප, අදහස්, විශ්වාස, මතිමතාන්තර, මනෝභාව, දෛනික ජීවන පැලපුම් ආදී සෑම දෙයක්ම තීරණය කරන ප්‍රබල සාධකය බවට මාධ්‍ය පත්ව ඇත. එහිදී ගුවන්විදුලි නාට්‍ය ආකෘතිය තුළින් සිදුවන බලපෑම ප්‍රබලය. නමුත් අද කාලය වනවිට ලාංකේය ගුවන්විදුලි නාට්‍ය දිනෙන් දින පරිහානියට ලක්වීමක් දැකිය හැක. වාණිජත්වයට මුල් තැනක් දී ගුවන්විදුලි නාට්‍ය ආකෘතිය සකස්වීම මෙයට හේතු වී ඇත. පෞද්ගලික ගුවන්විදුලි නාලිකා තුළ මේ ලක්ෂණය බහුලව පවතී. ගුවන්විදුලි නාට්‍ය පිළිබඳව ලාංකේය සමාජයේ පර්යේෂකයන් විසින් විවිධ පර්යේෂණ සිදු කර ඇත. නමුත් අද කාලයේ විකාශනය වන ගුවන්විදුලි නාට්‍ය මගින් විශේෂයෙන්ම වාණිජ අරමුණු පෙරදැරි කරගත් පෞද්ගලික ගුවන්විදුලි නාලිකාවන් හි විකාශනය වන ගුවන්විදුලි නාට්‍ය මගින් ජනසමාජයට වන බලපෑම පිළිබඳ පර්යේෂණ සිදුවී නැති තරම්ය. මෙවන් පසුබිමක් තුළ ගුවන්විදුලි නාට්‍ය මගින් ජන සමාජයට සිදු කරන බලපෑම පිළිබඳ විමසුමකට ලක් කිරීම වැදගත් කොට සලකමි. එමෙන්ම ජන සමාජයේ මෙම ආකෘතිය

කරන රසවින්දනමය, ආකල්පමය, සදාචාරමය හා භාෂාමය වශයෙන් සුවිශාල පරිහානියක් පෙන්නුම් කරයි. එම අනර්ථකාරී ස්වභාවය පිළිබඳව අවධානය යොමුකිරීම ද මෙම නිබන්ධනය මගින් සිදු කෙරේ.

## 1.2 පර්යේෂණ ගැටලුව

අද පවතින ශ්‍රී ලාංකේය රූපවාහිනී නාට්‍ය ජනසමාජය කෙසේ කිරීමෙහිලා බලපෑමක් සිදු කරන්නේ ද ?

## 1.3 පර්යේෂණ උපන්‍යාසය

ශ්‍රී ලාංකේය රූපවාහිනී නාලිකාවල විකාශනය වන අද පවතින නාට්‍ය ව්‍යුහකරණයන් වලින් ජන සමාජය කෙසේ කිරීමෙහිලා බලපෑමක් සිදු කරයි.

## 1.4 පර්යේෂණ අරමුණ

අද පවතින ශ්‍රී ලාංකේය රූපවාහිනී නාට්‍ය ජන සමාජයට බලපෑම සිදුකරන ආකාරය පිළිබඳ විධිමත් විශ්ලේෂණයක් සිදු කිරීම

### 1.4.1 පර්යේෂණ අභිමතාර්ථ

- නාට්‍ය කලාවේ ප්‍රභවය, විකාශනය පිළිබඳ කෙටි ගවේෂණයක් සිදු කිරීම.
- ජාත්‍යන්තර හා දේශීය වශයෙන් රූපවාහිනී නාට්‍යයේ ඓතිහාසික පසුබිම හා එහි වර්ධනය පිළිබඳ ගවේෂණය කිරීම.
- රූපවාහිනී නාට්‍ය ජන සමාජයට සිදුකරන සංස්කෘතික, ආර්ථික, දේශපාලනික, මනෝවිද්‍යාත්මක බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම.
- වර්තමාන ශ්‍රාවක සමාජය තුළ ගැස්වීමෙහිලා රූපවාහිනී නාට්‍ය බලපෑම සිදුකරන ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම.
- රූපවාහිනී නාට්‍යයන්හි විෂය ක්ෂේත්‍රවල තෝරා කර ඇති අන්තර්ගතය ජන සමාජයට කුමනාකාරයේ පණිවුඩ ලබා දෙන්නේදැයි ගවේෂණය කිරීම.
- රූපවාහිනී නාට්‍ය නිෂ්පාදනය වන්නේ කුමන අරමුණකින් ද යන්න පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම.
- රූපවාහිනී නාට්‍යයේ ගුණාත්මක භාවයක් ඇති කළ හැකි ආකාරය පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කිරීම.